# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 50 දරන
# උපරිමාධිකරන සංකීර්ණ කළමනාකාර මණ්ඩල පනත

---

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1987 දෙසැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 90 යි.   තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 24 වන දින]

එල්.ඩී.—ඕ.11/86

**උපරිමාධිකරණ සංකීර්ණයේ ගොඩනැගිලි කළමනාකරණය කිරීම සඳහා කළමනාකාර මණ්ඩලයක් පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම පිණිස ද එහි අරමුණු හා බලතල නිශ්චය කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) උපරිමාධිකරණ සංකීර්ණය හා එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් විය යුතු ය. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලය පිහිටුවීම.

(2) (අ) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, පොදු මුද්‍රාවක් සහ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය.

(ආ) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ පවරනු ලබන සියලු නඩු 7 වන වගන්තිය යටතේ පත් කරන ලද උපරිමාධිකරණ සංකීර්ණයේ මාෂල්වරයා විසින් හෝ ඔහුට විරුද්ධව හෝ පවරනු ලැබිය යුතු ය.

(3) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මණ්ඩලය විසින් උපරිමාධිකරණ සංකීර්ණයේ සීමා නිර්ණය කරනු ලැබිය යුතු ය. එම නියමයේ නිශ්චිතව සඳහන් සීමාවන් තුළට වැටෙන ඉඩම් හා ගොඩනැගිලි මණ්ඩලයේ පාලනය යටතේ පැවතිය යුතු ය.

**3.** (1) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :— උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලය.

(අ) අග්‍ර විනිශ්චයකාරවරයා ;

(ආ) අග්‍ර විනිශ්චයකාරවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙක් ;

(ඇ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා ;

(ඈ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් පත් කරනු ලබන අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක් ;

(ඉ) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

2—ඒ 09922—7,260 (87/10)

(ඊ) පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(උ) ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා ;

(ඌ) කොළඹ මහ නගර සභාවේ මහ නගර සභා කොමසාරිස්වරයා ;

(එ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ; සහ

(ඒ) නීතිය පිළිබඳව ප්‍රවීණතාවක් හා විශිෂ්ටත්වයක් දරන බවට පිළිගනු ලැබ ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ; මේ ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) කලින් ඉල්ලා අස් වුවහොත් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, සෑම පත් කළ සාමාජිකයකු ම අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් සඳහා ධූරය දැරිය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් කවර හෝ අවස්ථාවක දී කිසිම හේතුවක් නොදක්වා, පත් කළ සාමාජිකයකු ධූරයෙන් ඉවත් කළ හැකි ය.

(4) ජනාධිපතිවරයා අමතන ලිපියක් මගින්, පත් කළ සාමාජිකයකුට සිය ධූරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(5) පත් කළ සාමාජිකයකු මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ධූරය හිස් කළ අවස්ථාවක ජනාධිපතිවරයා විසින් (1) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඒ ධූරය හිස් කළ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය. එසේ පත් කරනු ලබන සෑම සාමාජිකයෙක් ම තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවූ කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(6) අයහපත් සෞඛ්‍ය තත්ත්වය, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධූරයේ කටයුතු කිරීමට පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක ඔහු වෙනුවෙන් වැඩබැලීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(7) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක්, 8 වන වගන්තියෙන් පිහිටුවන ලද උපරිමාධිකරණ සංකීර්ණයේ අරමුදලෙන්, මණ්ඩලයේ සාමාජිකයන් සියලු දෙනාටම හෝ ඉන් කිසිවකුට ගෙවනු ලැබිය හැකි ය.

(8) කාලය ඉකුත්වීම නිසා ධුරය අත්හරින පත් කළ සාමාජික යෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

4. (1) අග්‍ර විනිශ්චයකාරවරයා මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට අග්‍ර විනිශ්චයකාර වරයා පැමිණ නැති අවස්ථාවක දී එම රැස්වීමට පැමිණ සිටින ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා එම රැස්වීමේ මූලාසනය දැරිය යුතු අතර මණ්ඩලයේ යම් රැස්වීමකට විනිශ්චයකාරවරයකු පැමිණ නැති අවස්ථාවක දී එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තමන් අතුරින් කෙනකු සභාපතිවරයෙකු ලෙස තෝරා පත් කරගත යුතු ය. මණ්ඩලයේ රැස්වීම.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය, රැස්වීම පවත්වන දිනයෙහි ධුර දරන මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යා වෙන් තුනෙන් එකක් විය යුතු ය. එම සංඛ්‍යාවෙන් තුනෙන් එක සම්පූර්ණ සංඛ්‍යාවක් හා භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක එම සම්පූර්ණ සංඛ්‍යාව සහ භාග සංඛ්‍යාවට ඉහළ ආසන්නතම සම්පූර්ණ සංඛ්‍යාව, මේ උපවගන්තියේ කාර්ය සඳහා තුනෙන් එක වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(4) සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන්ම පමණක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් නැත හොත් අක්‍රමිකතාවක් තිබීමේ හේතුවෙන්ම පමණක් හෝ සභාවේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

5. මණ්ඩලයේ මුද්‍රාව— මණ්ඩලයේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; තව ද

(ඇ) සභාවේ අනුමතය ඇතිව සහ, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, යම් ලියවිල්ලකට නොතැබිය යුතු ය.

6. උපරිමාධිකරණ සංකීර්ණය සහ එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම ද සංකීර්ණයේ සහ එහි ගොනැගිලිවල ඇති පහසුකම් වැඩි කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඊට අලුතින් කොටස් එකතු කිරීම වෙනස් කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම ද මණ්ඩලයේ පරමාර්ථය වන්නේ ය. මණ්ඩලයේ පරමාර්ථය.

මණ්ඩලයේ බලතල.

7. (1) ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික විය හැකි සියලු දේ කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන දේ කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ආධාර මුදල්, ත්‍යාග හෝ ප්‍රදාන ලබා ගැනීම ;

(ආ) උපරිමාධිකරණ සංකීර්ණයේ ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් කුලියට හෝ බද්දට දීම ;

(ඇ) මණ්ඩලයේ පරමාර්ථය හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට සහ එකඟවීම් වලට කෙළින්ම හෝ, මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයන්, සේවකයන් හෝ අනුයෝජිතයන් මගින් හෝ එළඹීම හෝ එම ගිවිසුම් හෝ එකඟවීම් කෙළින්ම නැතහොත් එකී නිලධරයන්, සේවකයන් හෝ අනුයෝජිතයන් මගින් ඉටු කිරීම ;

(ඈ) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා වන "උපරිමාධිකරණ සංකීර් ණයේ කළමනාකාර මණ්ඩලයේ මාෂල්වරයකු" සහ මණ්ඩලයේ පරමාර්ථය ඉටු කර ගැනීම හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ එම මාෂල්වරයා, නිලධරයන් සහ සේවකයන් පිළිබඳ (ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය ඇතුලුව) විනය පාලනය ;

(ඉ) (ඈ) ඡේදය යටතේ පත් කරන ලද මාෂල්වරයාගේ, නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි තීරණය කිරීම ;

(ඊ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පත් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම ;

(උ) මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය පිළිබඳව වූ යම් කාරණ යක් ගැන විභාග කර වාර්තා කිරීමේ කාර්යය සඳහා සුදුසු යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකින් යුක්ත කමිටු, මණ්ඩලයේ සාමාජිකයන් අතරින් පත් කිරීම ;

8. (1) මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "උපරිමාධිකරණ සංකීර්ණයේ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු ය. උපරිමාධිකරණ සංකීර්ණයේ අරමුදල.

(2) අරමුදලේ පාලනය හා කළමනාකරණය, මණ්ඩලය සතු වන්නේ ය.

(3) පහත දැක්වෙන මුදල්, අරමුදලට ගෙවිය යුතු ය:—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවවලින් මණ්ඩලයට ලැබෙන සියලු ප්‍රදාන හා ත්‍යාග ;

(ආ) මණ්ඩලය විසින් කුලියට දෙන ලද හෝ බදු දෙන ලද යම් ගොඩනැගිලි හෝ ඉඩම්වල කුලිය වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලුම මුදල් ;

(ඇ) 9 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබුණු යම් ප්‍රදානයක්.

(4) පහත දැක්වෙන මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) උපරිමාධිකරණ සංකීර්ණය සහ එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීමෙහි ලා සහ එහි අළුතින් කොටස් තැනීම්, වෙනස් කිරීම් සහ වැඩි දියුණු කිරීම් සම්බන්ධව මණ්ඩලය විසින් දරන ලද වියදම ;

(ආ) මණ්ඩලයේ නිලධරයන්ට සහ සේවකයන්ට වැටුප්, පාරිතෝෂික මුදල් සහ වෙනත් පාරිශ්‍රම ගෙවීමෙහි ලා මණ්ඩලය විසින් දරන ලද වියදම් ;

(ඇ) මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි දී මණ්ඩලය විසින් දරන ලද වියදම් සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ඈ) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ අරමුදලින් ගෙවීමට නියමිත යම් මුදලක්.

9. මණ්ඩලයේ පරමාර්ථය ඉටු කර ගැනීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් වන ආධාර මුදලක් (තීරුබදු සඳහා වූ ප්‍රදානයක් ඇතුළුව) ආණ්ඩුව විසින් වාර්ෂිකව මණ්ඩලයට ප්‍රදානය කළ හැකි ය. ආණ්ඩුව විසින් දෙනු ලබන වාර්ෂික ආධාර මුදල.

ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

**10.** මණ්ඩලයට මුදලින් හෝ වෙනත් ආකාරයකින් කරනු ලබන සෑම ආධාරයක්ම, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්යය සඳහා, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලට මුදලින් හෝ වෙනත් ආකාරයකින් දෙන ලද ප්‍රදානයක් සේ සලකනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**11.** (1) අරමුදලේ ලැබීම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අරමුදලේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව මණ්ඩලය විසින් නිසි ගිණුම් තැබීමට සැලැස්විය යුතු ය.

(2) අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ විය යුතු ය.

මාෂල්වරයාගේ කාර්ය.

**12.** මේ පනත මගින් මණ්ඩලයට පැවරී, නියම වී හෝ පනවා ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් 7 වන වගන්තිය යටතේ පත් කරන ලද උපරිමාධිකරණ සංකීර්ණයේ කළමනාකාර මණ්ඩලයේ මාෂල්වරයාට මණ්ඩලය විසින් පැවරිය හැකිය :

එසේ වුවද, එවැනි පැවරීමක් කර තිබුණ ද කවර හෝ වේලාවක එම බලය, කාර්යය හෝ කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**13.** (1) මණ්ඩලයේ ඉල්ලීම පිට රජයේ සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලපරිච්ඡේදයක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. එසේ නැතහොත් ඔහු එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 114 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූලව යම් උපලේඛනගත රජයේ නිලධරයකු, එම නිලධරයාගේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලපරිච්ඡේදයක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. එසේ නැතහොත් ඔහු එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරන ලද අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) නිශ්චිත කාලපරිච්ඡේදයක් ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කර ගනු ලැබූ අවස්ථාවක එම තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් සේවා කාලයක්, එම ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කරන ලද සේවා කාලයක් වශයෙන් සැලකිය යුතු ය.

පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන් සහ නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

14. (1) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ දී මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් ගෙවන ලද, හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මෙම පනත යටතේ හෝ මණ්ඩලයේ නියමය මත හෝ කරනු ලබන නැතහොත් කරනු ලබන්නේ යයි අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් ඔහු විසින් දරනු ලැබූ යම් වියදමක්, එම ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යුක්තව බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් එම වියදම සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගෙන ඇත්තේ නම් මිස, මෙම අරමුදලින් ගෙවිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

15. මණ්ඩලයේ සියලුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය, අල් ලක් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වන බව.

**16.** මණ්ඩලය, අල් ලක් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධි විධාන ඒ අනුව අදාළ විය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ වරප්‍රසාද ඉතිරිකර ගැනීම.

**17.** මේ පනතේ කිසිවක්, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ එහි විනිශ්චය කාරවරයන්ගේ ද අභියාචනාධිකරණයේ සහ එහි විනිශ්චයකාර වරයන්ගේ ද බලතල සහ වරප්‍රසාද කෙරෙහි බල නොපෑ යුතු හෝ හානි කර නොවිය යුතු අතර ඒවා එසේ බලපාන ලෙස හෝ එසේ හානි කර වන ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය.

1979 අංක 7 දරන පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 18 වගන්තිය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ:—

(අ) "නියම බලධරයා" යන්නෙහි අර්ථ කථනයේ (උ) ඡේද යට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(උඋ) එම ඉඩම උපරිමාධිකරණ කළමනාකරණ මණ්ඩලයට සතු වී හෝ එහි පාලනය යටතේ හෝ ඇති අවස්ථාවක උපරිමාධිකරණ කළමනාකරණ මණ්ඩලයේ මාෂල්වරයා ;" සහ

(ආ) "රජයේ ඉඩම්" යන්නෙහි අර්ථකථනයේ "1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත" යන වචන වෙනුවට "1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ හෝ 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩල පනත" යන වචන ආදේශ කිරීමෙන්.

අර්ථ නිරූපනය.

**19.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි "උපරිමාධිකරණ සංකීර්ණය" යන්නෙන් 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයන් මගින් නිශ්චය කරන ලද සීමාවක් තුළට වැටෙන බිම් ප්‍රමාණය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සියලු පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වනදාට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.